# 10 සාරාංශකරණය

ලේඛනයක, ලිපියක, කථාවක, ඡේදයක, වාර්තාවක සාරවත් නැතහොත් හරවත් ම කොටස සාරාංශය ලෙස හැඳින්විය හැකි ය. වචන රැසකින් යුක්ත පාඨයක ප්‍රධාන අර්ථය ගිලිහී නොයන සේ හකුළුවා ලිවීම සාරාංශකරණය නම් වේ. ඇසීමෙන්, දැකීමෙන්, කියවීමෙන්, විඳීමෙන් අප ලබන සියලු අත්දැකීම් අන් අයට පැවසීමේ දී ඔවුනට ඉතා පහසුවෙන් අවබෝධ වන ලෙස සිදු කිරීමට හැකි නම් එය ඉතා අගනේ ය. සාරවත් දෑ සැම විට ම වටිනාකමින් ඉහළ නිසා අන් අයට තම අදහස ප්‍රකාශ කිරීමේ දී සමස්ත අර්ථය ඉස්මතු වන සේ කැටි කොට හරවත් දෑ පමණක් දක්වීම ඉතාම සුදුසු ය. ලේඛන ව්‍යවහාරයේ දී වාක්‍ය අලංකාර කිරීම සඳහා බාහිර සැරසිලි නිතර භාවිත කරනු ලැබේ. ඒවා අර්ථාලංකාර හා ශබ්දාලංකාර යනුවෙන් දෙවැදෑරුම් වේ. එහෙත් සාරාංශකරණයේ දී සියලු බාහිර සැරසිලි ඉවත් කොට එහි මුඛ්‍යාර්ථයට ප්‍රධානත්වය දීම විශේෂ ලක්ෂණයකි. සාරාංශකරණයේ මූලික ක්‍රම ශිල්ප දැන ගැනීම ප්‍රයෝජනවත් වේ. සාරාංශය සැම විට ම තමාගේ ම නිර්මාණයක් වීම සුදුසු ය.

**පහත සඳහන් ඡේදය හොඳින් කියවන්න**



සිංහලයාගේ ජන ජීවිතය සමග විවිධ උත්සව සම්බන්ධ වේ. එකී සැම උත්සවයක දී ම බුලතට වැදගත් ස්ථානයක් හිමි වේ. මංගල අවමංගල උත්සවවල දී පමණක් නොව වැඩිහිටියන්, ගුරුවරුන්, භික්ෂූන් පිදීමේ දී බුලත් භාවිත වනු පෙනේ. සිංහල සංස්කෘතියෙහි පමණක් නොව ඉන්දියාව, බුරුමය, පාකිස්ථානය, බංගලාදේශය යන වෙනත් රටවල ද බුලත්විට කෑමට පමණක් නොව වෙනත් විවිධ අවස්ථාවල දී ද එය භාවිත කරයි. මෙහි දී අපගේ අවධානය යොමු වනු ලබන්නේ සිංහල සමාජය හා බුලත් අතර ඇති සම්බන්ධය පිළිබඳ කෙටි සමාජ විද්‍යාත්මක විමසුමක් කිරීමට ය. එම සාකච්ඡාවෙන් සිංහල සමාජයේ බුලත යනු විට කෑමට ගන්නා කොළ විශේෂයක් පමණක් නොව ඊට වඩා ගැඹුරින් අර්ථ ගෙන දෙන දෙයක් බව පෙන්නුම් කෙරේ.

ශ්‍රී ලංකා සමාජය පිළිබඳ විමසුමක්.
එන්. වී. ජී. ඒ. හේමන්ත කුමාර.

ඉහත ඡේදය 1/3ක් වන සේ සාරාංශ කළ විට පහත සඳහන් වන සේ ලියා දැක්විය හැකි ය.



සිංහලයන්ගේ විවිධ උත්සවවල දීත්, සාම්ප්‍රදායික චාරිත්‍රවල දීත් බුලත් භාවිත කරනු සුලබ ව දකිය හැක. බුලත් ශ්‍රී ලංකාව ඇතුළු දකුණු ආසියාතික රටවල සංස්කෘතියේ සංකේතයකි. සිංහල සමාජය හා බුලත් අතර සම්බන්ධය සමාජ විද්‍යාත්මක ව විමසා බලන විට පැහැදිලි වන්නේ බුලත් විට කෑමට ගන්නා කොළ විශේෂයක් පමණක් නොවන බව යි.

මුලින් සඳහන් ඡේදය පාඨකයා විසින් කියවීමේ දී එහි අන්තර්ගත මූලිකාර්ථය වඩා හරවත් ව ඉදිරිපත් කිරීමට ලේඛනය හසුරුවාගෙන තිබේ. ඒ සඳහා ලේඛකයා වචන රැසක් යොදා ගෙන ඇත. ලේඛන ව්‍යවහාරයේ දී යොදා ගන්නා උපමා, රූපක වැනි අලංකාර, විශේෂණ, පුනරුක්ත, උදාහරණ, නිපාත වැනි දෑ භාවිතයෙන් මුල් ඡේදය සැරසිලි කර ඇති බව පෙනේ.

මුල් ඡේදයේ අදහස රැගෙන ඊට හානියක් නොවන සේ පසු ව ලියා ඇති ඡේදය එකී ඡේදයේ සාරාංශයකි. එනම් මුල් ඡේදයේ මූලිකාර්ථය පමණක් රැගෙන හකුළුවා ලිවීමකි. දෙවන වර ලියා ඇති ඡේදයෙන් ද මුල් ඡේදයේ අදහස ඉස්මතු ව පෙනේ. අදහස අලංකාර කිරීම සඳහා භාවිත කළ සැරසිලි දෙවන ඡේදයේ නොමැත. එසේ ඉවත් කිරීමෙන් ඡේදයේ මූලිකාර්ථයට හානියක් නොවන සේ සංක්ෂිප්ත ව අදහස් ඉදිරිපත් කිරීම සාරාංශකරණය නම් වේ.



ට්‍රිං ට්‍රිං ට්‍රිං

සමිත පොඩි හාමුදුරුවෝ :- තෙරුවන් සරණයි !

උදිත පොඩි හාමුදුරුවෝ :- තෙරුවන් සරණයි! මම උදිත පොඩි හාමුදුරුවෝ කථා කරන්නේ. මට සමිත පොඩි හාමුදුරුවන්ට කථා කරන්න පුලුවන් ද ?

සමිත පොඩි හාමුදුරුවෝ :- මේ කථාකරන්නේ සමිත පොඩි හාමුදුරුවෝ තමයි.

උදිත පොඩි හාමුදුරුවෝ :- මට අද පිරිවෙනට එන්න බැරි වුණා. තරමක අසනීප ගතියක් නිසා. ඔබ වහන්සේ පිරිවෙනට ගියාද?

සමිත පොඩි හාමුදුරුවෝ :- ඔව්; මම අද පිරිවෙන් ගියා. මමත් කල්පනා කළා, මොකද අද ඔබවහන්සේ පිරිවෙනට වැඩියෙ නැත්තෙ කියලා. දැන් කොහොමද අසනීපය? බෙහෙත් ගත්තා ද?

උදිත පොඩි හාමුදුරුවෝ :- ලොකු හාමුදුරුවො එක්ක ගිහින් බෙහෙත් ගත්තා. ඒත් තවම ඇඟට පණ නැහැ. මම කතා කළේ උදව්වක් ඉල්ලන්න.

සමිත පොඩි හාමුදුරුවෝ :- කියන්න පොඩි හාමුදුරුවනේ, මට පුළුවන් වෙයි ඔබ වහන්සේට උදවු කරන්න.

උදිත පොඩි හාමුදුරුවෝ :- අසනීප ගතිය අඩු උණොත් මට හෙට පිරිවෙන් එන්න පුළුවන් වෙයි. නමුත් හෙට කරගෙන එන්න කියලා දුන්න වැඩ මොනවාද කියලා මම දන්නැහැනෙ. ඒ නිසා කරගෙන එන්න කියලා දුන්න වැඩ ටික මට කියන්න පුළුවන් ද?

සමිත පොඩි හාමුදුරුවෝ :- ආ ! ඒක සුළු උදව්වක්නෙ. මම කියන්නම්. නමුත් දූරකථනයෙන් කියන්න ගියොත් වැඩි වෙලාවක් ගත වේවි.

| | | |
|---|---|---|
| උදිත පොඩි හාමුදුරුවෝ | :- | ඒකත් ඇත්ත තමයි. එහෙනම් මම අපේ පන්සලේ ඉන්න සියාතු මාමාව එවන්න ද? |
| සමිත පොඩි හාමුදුරුවෝ | :- | ඒකනම් හොඳයි. මම සියාතු මාමා අතේ සියලු විස්තර එවන්නම්. සියාතු මාමා එවන විට ගිය සතියේ ඔබ වහන්සේ මගෙන් බලන්න ඉල්ලාගත්ත බුදුගුණ අලංකාරය පොතත් එවන්න. |
| උදිත පොඩි හාමුදුරුවෝ | :- | හොඳයි. මම ඒ පොත එවන්නම්. එහෙනම් ඔබ වහන්සේට තෙරුවන් සරණයි! මම නවතින්නම්. |
| සමිත පොඩි හාමුදුරුවෝ | :- | ඔබ වහන්සේටත් තෙරුවන් සරණයි! |

වර්තමානයේ අදහස් හුවමාරු කර ගැනීමේ දී නවීන තාක්‍ෂණ මෙවලමක් වන දූරකථන භාවිතය සුලබ ව දැක ගත හැකි ය. එහි දී අනවශ්‍ය ලෙස දීර්ඝ ව කරුණු දැක්වීම සුදුසු වන්නේ නැත. එය වියදම් අධික ක්‍රියාවක් මෙන් ම කාලය ද නාස්ති වීමකි. ඉහතින් දැක්වූ සමිත පොඩි හාමුදුරුවෝ සහ උදිත පොඩි හාමුදුරුවෝ අතර සිදු වූ දූරකථන සංවාදය ද කෙටියෙන් සිදු වූවා නම් ඉතා සුදුසු ය. විශේෂයෙන් වර්තමානයේ ජංගම දූරකථන භාවිතයේ දී සමාජයේ අන් අයට ද හිරිහැරයක් වන සේ යොදා ගන්නා ආකාරය අප දැක ඇත. දූරකථන භාවිතය ගැන සැලකිලිමත් වන්නකු තමන්ගේ අදහස් හරවත් ව, කෙටියෙන් අනෙකාට පැවසීම යෝග්‍ය වේ. සාරාංශකරණයේ මූලික ලක්‍ෂණ දැන ගැනීම වර්තමානයේ මෙවැනි සමාජ සම්බන්ධතා පැවැත්වීමේ දී ද බෙහෙවින් ප්‍රයෝජනවත් වේ. මීට අමතර ව පුවත්පත් වාර්තා, තීරු ලිපි සම්පාදනයේ දී ද සාරාංශකරණ මූලධර්ම හඳුනා ගෙන භාවිත කිරීමට පෙළඹීම එදිනෙද කටයුතු පහසු කරයි.

## සාරාංශකරණයේ දී දැන ගත යුතු මූලිකාංග රාශියකි.

- දෙන ලද ඡේදයේ සෑම වචනයක් ම සැලකිල්ලට ගෙන කීප වරක් කියවා එහි මූලිකාර්ථය හොඳින් තේරුම් ගැනීම.
- දෙවන වර, තෙවන වර කියවීමේ දී ප්‍රධාන අරුත මතු වන ස්ථාන සලකුණු කර ගැනීම.
- අනවශ්‍ය කරුණු (උපමා, අලංකාර, විශේෂණ, පුනරුක්ති, නිපාත, උදාහරණ) සලකුණු කර ගැනීම.
- ඡේදයේ මූලිකාර්ථය මතු වන සේ තමන්ගේ වචනවලින් සරල ව ලිවීම සහ මුල් ඡේදයේ අදහස් සමග ගැළපීම.
- සාරාංශය තමාගේ ම නිර්මාණයක් සේ තනි ඡේදයකින් ලිවීම සහ අක්‍ෂර වින්‍යාසය, පද බෙදීම, විරාම ලක්‍ෂණ, උක්තාඛ්‍යාත සම්බන්ධය ගැන සැලකිලිමත් වීම.
- සාරාංශයට අවශ්‍ය වචන ප්‍රමාණය දක්වා නොමැති නම් දෙන ලද ඡේදය 1/3ක් වන සේ ලිවීම.

**ක්‍රියාකාරකම 10.1**

පහත සඳහන් පාඨයෙහි සාරාංශය 1/3ක් වන සේ ලියන්න.

සාහිත්‍යය කලාවකි. අදහස් හා හැඟීම් මිනිස් සිතට කාවදින සේ කීමේ විශිෂ්ට බලයක් සාහිත්‍යය කලාව සතු ය. ගද්‍ය සාහිත්‍යයටත් වඩා පද්‍ය සාහිත්‍යය මේ කාන්ත ගුණයෙන් උසස් තැනක් ගනී. පද්‍යය ගීතවත් ය. ශ්‍රවණ මාධූර්යයෙන් යුක්ත ය. පද්‍යයෙන් නගන මේ ගීත ස්වරය හෙවත් හඬ, මගින් කිසියම් හැඟීමක් අනිකකුගේ සිතට කාවදින ලෙස කීමට කවියා සමත් වේ. උත්තම ගණයේ කවීහූ පද සංඝටනයෙන් නගින හඬ වහල් කර ගැනීමෙන් කවියේ අර්ථයෙන් ප්‍රකාශ කරන භාවයන් උද්දීපනය කරති.

**ක්‍රියාකාරකම 10.2**

(i) ඔබ කැමති සති අන්ත පුවත්පතක කර්තෘ වාක්‍යයක් සාරාංශ කොට දක්වන්න.

(ii) පහත සඳහන් ඡේදය හොඳින් කියවා 1/3ක් වන සේ සාරාංශ කර ලියන්න.

ලොව දියුණු යැයි සලකන බොහෝ රටවල් සංවර්ධනය යැයි සලකන්නේ පරිසර සම්පත් හැකි තරම් ඉක්මනින් භාවිත කරමින් තාක්ෂණික වශයෙන් දියුණුවක් කරා යෑම ය. එම තාක්ෂණික දියුණුව බොහෝ විට මානව හිතවාදී බවෙන් තොර වූවකි. පරිසර හිතකාමී නොවූවකි. දියුණු යැයි කියා ගන්නා එම තාක්ෂණය භාවිත කරමින් සමස්ත සත්ත්ව ප්‍රජාවට ම හානිකර වූ පර්යේෂණ කරනු දක්නට ලැබේ. මෙලොව පරලොව සැපත සලසන සොඳුරු දහමකින් පෝෂණය නොලැබූ ඔවුන්ගේ මේ ගමනේ දූරදර්ශී බවක් නොමැත. එහි එක් ප්‍රතිඵලයක් ලෙස ඉදිරි වර්ෂ පනහක කාලය තුළ ගල් අඟුරු හා ගෑස් ද වසර සියයක කාලය තුළ ඛනිජ තෙල් ද මුළුමනින් ම අවසන් වීමට ඉඩ ඇත.